සැ. යු.-2011.12.30 දින පළ වූ අංක 1,739 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,740 - 2012 ජනවාරි මස 06 වැනි සිකුරාදා - 2012.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 4 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 8 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජනවාරි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 දෙසැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1 - B 80393—8,915 (2011/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය** ඃ

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කිලිනොච්චිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 පෙබරවාරි මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කිලිනොච්චි | පූනාකරි | පල්ලවරායන්කඩ්ඩු බටහිර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය සහ පූනාකරි කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි. |

01-95

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 පෙබරවාරි මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අම්පාර | ලාහුගල | පානම පත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය/ උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

01-62

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මීට යාකර ඇති අයදුම්පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2012.01.23 වැනි දින හෝ ඊට පෙරාතුව ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 07, අංක 230, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ උඩ වම්පස කෙළවරේ "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය.

මෙම දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *වැටුප් ක්‍රමය*.- පුහුණුවීම් කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු මෙම තනතුර සඳහා මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය රුපියල් 15,005 - 4 x 180 - 14 x 240 - රු.19,085 වේ. (රු. 16,205 ට වාර්ෂික වැටුප් පියවරට පූර්වයෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ඇත.)

3. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය
(ආ) 2012.01.23 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට වැඩි නොවිය යුතු ය. (පළාත් හා රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් කෙරෙහි ඉහළ වයස් සීමාව බලපාන්නේ නැත.) ;
(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතු ය ;
(ඈ) යහපත් සෞඛ්‍ය තත්වයෙන් යුතු අයෙකු විය යුතුය. ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ හැකි වන පරිදි වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍යය ;
(ඉ) පහත සඳහන් I. II, III. IV යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලින් එකක් ලබා තිබිය යුතුය :-

(i) භාෂාව, ගණිතය, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ තවත් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම, ;

සමග

භෞතික විද්‍යාව හා ශුද්ධ ගණිතය ඇතුළුව අවම වශයෙන් විෂයයන් හතරකින් (04) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම ;

හෝ

නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හා සංයුක්ත ගණිතය ඇතුළුව විෂයයන් තුනකින් (03) සාමාන්‍ය සාමාර්ථයන් සහිතව එක් වරක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම.

(ii) එක් අවුරුද්දක ප්‍රායෝගික (ක්ෂේත්‍ර) පුහුණුවක් සහිතව මොරටුව විශ්ව විද්‍යාලයෙන් හෝ අම්පාර හාඩි කාර්මික විද්‍යාලයෙන් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය (සිවිල් ඉංජිනේරු) ලැබ සිටිය යුතු අතර, මැනීම හා මට්ටම් ගැනීම සහ වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් ද ඇතුළත්ව අදාළ විභාගය සමත් වී තිබිය යුතුය.

(iii) මට්ටක්කුලිය උසස් තාක්ෂණික ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව හා මිනුම් හා මට්ටම් ගැනීම යන විෂයන් ද ඇතුළත්ව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

(iv) කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු විද්‍යාව හා මිනුම් හා මට්ටම් ගැනීම යන විෂයන් ද ඇතුළත්ව සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව ජාතික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

සටහන - පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැකි අතර, ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නමුත් සහතිකයේ බලාත්මක දිනය ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර විය යුතු ය.

4. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) සියලු ම බඳවා ගැනීම් අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදු කෙරෙනු ඇත.

(ආ) (i) ඉහත 3 (ඉ) i යටතේ සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගල්ගමුව අභ්‍යාස ආයතනයේ නේවාසිකව වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලාව දෑවුරුදු කාල සීමාවක් තුළ හැදෑරිය යුතු ය. එහි දී අවසාන ලිඛිත පරීක්ෂණය ඇතුළුව නියමිත විභාගවලින් සමත්වන අභ්‍යාසලාභීන් එක් අවුරුදු ප්‍රායෝගික පුහුණුවක් සඳහා ක්ෂේත්‍රයට අනුයුක්ත කරනු ඇත. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන සේ සතුටුදායක ලෙස එම ක්ෂේත්‍ර පුහුණුව නිම කිරීමෙන් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභ්‍යාස ආයතනය මගින් පිරිනමනුලබන වාරිමාර්ග ඉංජිනේරුමය ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම් ලබති.

(ii) නියමිත විභාගවලින් අසමත් වන වාරිමාර්ග ආධුනිකයින්ට එසේ අසමත් වූයේ වැඩ කටයුතු පැහැර හැරීම, උනන්දුව නැතිවීම හෝ අයහපත් පැමිණීම නිසා නොවේනම්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඔවුන්ගේ පුහුණුව මාස හයකට නොවැඩි කාල පරිච්ඡේදයකින් දීර්ඝ කරවා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇත. අසමත් වූ ආධුනිකයින් එසේ දීර්ඝ කරන ලද පුහුණුවීමේ කාල පරිච්ඡේදය අවසානයේ දී ඔවුන් සඳහා පවත්වන අවසාන විභාගය ඇතුළු නියමිත විභාග සියල්ලෙන් ම සමත්විය යුතු ය. එම විභාග ද අසමත් වන ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

(iii) පුහුණුව ලබන කාලය තුළ දී ආධුනිකයින් යටත් පිරිසෙයින් දේශනවලින් 80% කටවත් සහභාගී වී සතුටුදායක පුහුණු වීම් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අවශ්‍ය අවම පැමිණීම හා සතුටුදායක පුහුණුවීමේ වාර්තාවක් නැති යම්කිසි ආධුනිකයෙක් වෙතොත් නියමිත විභාගයට පෙනී සිටීමට ඉඩ නොදෙන අතර, පුහුණුව ද අවසන් කරනු ලැබේ.

(iv) ඉහත 3 (ඉ) (ii) (iii) (iv) යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව බඳවා ගන්නා ලද ආධුනිකයින් දේශන හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වනසේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන හයමසක පුහුණුවකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) මෙම අභ්‍යාසලාභීන් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ සාර්ථකව ලබාගෙන ඇත්නම් බඳවාගැනීමෙන් පසුව ආධුනිකයින් ලැබිය යුතු හය (06) මසක පුහුණුවීමේ කාල සීමාවෙන් නිදහස් කරනු ලබන අතර, ඔවුන් සියළු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිට සමත්විය යුතු ය.

(ඈ) සියලු ම දේශන හා පුහුණු පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

(ඈ) පුහුණුව සාර්ථකව අවසාන කරන අය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුරට ත් කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් ප්‍රථම වශයෙන් වාරිමාර්ග ආධුනිකයින් වශයෙන් බඳවා ගැනේ.

(ඇ) වාරිමාර්ග ආධුනිකයින් සඳහා පුහුණුව ලබන කාලසීමාව තුළ දෙනු ලබන දීමනාවන් 3. (ඉ) (i) සුදුසුකම් සහිතව බඳවා ගනු ලැබූ වාරිමාර්ග ආධුනිකයින් හට පුහුණුව ලබන සම්පූර්ණ කාලය තුළ දී පහත සඳහන් පරිදි දීමනාවන් ගෙවනු ලැබේ.

පළමු වසර සඳහා මසකට රු. 12,920 බැගින්,
දෙවන වසර සඳහා මසකට රු. 13,040 බැගින්,
තුන්වන වසර සඳහා මසකට රු. 13,160 බැගින්,

3. (ඉ) (i),(ii), (iii), (iv), සුදුසුකම් සහතිව බඳවා ගන්නා ලද ආධුනිකයින් හට ඔවුන්ගේ හය මසක පුහුණු කාලය තුළ දී මසකට රු. 13,160 බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

මෙම දීමනාව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අවසරය පරිදි දීර්ඝ කරනු ලබන පුහුණුවීමේ කාල පරිච්ඡේදයෙහි දී ලැබීමට හිමිකම් ඇත. වෙනත් වරප්‍රසාද හෝ හිමිකම් කිසිවක් නොලැබේ.

(ඈ) වාරිමාර්ග ආධුනිකයින් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා රජය මගින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසිවලට යටත්විය යුතු ය. පුහුණුව ලබන කාල සීමාව තුළ දී ඔවුනට නිවාඩු හෝ නිවාඩු දුම්රිය බලපත් ලැබීමට හිමිකම් නැත.

(ඉ) මෙම පත්වීම් ආධුනික කාලය සම්පූර්ණ කරන ලදුව II වැනි පන්තිය II වැනි ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(ඊ) මෙම සේවය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළ වේ.

(උ) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් වසර 05 ක අනිවාර්ය සේවා කාලයක් ඉංජිනේරු සහකාර තනතුරේ සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කළ යුතුය. ඊට පෙර සේවයෙන් ඉවත් වීමට අවශ්‍ය වුවහොත් ගිවිසුමේ සඳහන් මුදල රජයට ගෙවිය යුතු ය.

6. අයදුම්කරු අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු ය. :-

(i) ලබාගෙන ඇති තාක්ෂණික සහතිකයන්,
(ii) අ.පො.ස. (උ.පෙළ) සහතික පත්‍රය,
(iii) අ.පො.ස. (සා.පෙළ) සහතික පත්‍රය,
(iv) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතිකය ;
(v) මෑතක දී ලබාගත් චරිත සහතික තුනක් (මින් එක් සහතිකයක් අවසන් වරට ඉගෙනගත් පාසලේ හෝ විද්‍යාලයේ විදුහල්පතිගෙන් සහ තවත් සහතිකයක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියාගේ විය යුතු ය.)

සටහන - ඉහත සඳහන් සහතිකවල පිටපත් ආපසු දෙනු නොලැබේ.

7. පළාත් සහ රාජ්‍ය සේවාවන් හි නියුතු සේවකයින් ඔවුන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය.

8. අයදුම්කරුවන් කොළඹ දී පැවැත්වෙන ලිඛිත විභාගයකට සහ සම්මුඛ පරීක්ෂණයකට ඔවුන්ගේ ම වියදමින් පෙනී සිටිය යුතු ය.

9. සේවා අවශ්‍යතාවය මත ඕනෑම අවස්ථාවක දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ඔවුන් සූදානමින් සිටිය යුතු ය. දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිම් බොහෝවිට ප්‍රවාහන හා නවාතැන් පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති බව අයදුම්කරුවන් වටහා ගත යුතුය. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් විශේෂයෙන් ම පහත සඳහන් සේවා ස්ථානවලට අනුයුක්ත කරන අතර එම සේවා ස්ථානවල අවම වශයෙන් අවුරුදු 05 ක් සේවය කළ යුතු ය. එම සේවා ස්ථානවල සේවය කිරීමට අකමැත්තක් දක්වන අය ඉල්ලුම්පත් ඉදිරිපත් නොකල යුතු ය. එම සේවා ස්ථාන අම්පාර, පොතුවිල්, කල්මුණේ, අක්කරපත්තු, පදවිය, රාජාංගනය, හුරුළු වැව, මාපාකඩ, බදුල්ල, කන්දකැටිය, නවකිරි, රූගම්, තිස්ස, වීරකැටිය, හම්බන්තොට, වැල්ලවාය, බිබිල, මොණරාගල, පොළොන්නරුව, කවුඩුල්ල, ඇළහැර, ඉඟිනිමිටිය, පුත්තලම, මුතූර්, කන්තලේ, ගෝමරන්කඩවල, මුරුක්කන්, වවුනියාව වැනි වාරිමාර්ග කොට්ඨාස සහ ව්‍යාපෘති කාර්යාල වේ.

10. අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබීමට ඉඩ තිබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගනු ලැබීමෙන් අනතුරුව අනාවරණය වුවහොත් ඔහුගේ සේවය අවසන් කෙරෙනු ඇත. මීට අමතරව අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට එරෙහිව නීති මඟින් දඬුවම් ලබාදීමට සිදුවනු ඇත.

11. රජයේ තනතුරුවලට පත් කරගනු ලැබීම සම්බන්ධයෙන් බලපවත්වන රීති සහ රෙගුලාසි සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජයේ ගැසට් පත්‍රයේ I කොටසේ (II) අ ඡේදය කෙරෙහි අවධානය යොමු කෙරේ.

———————,
ආචාර්ය (ඉංජි) ජී. ජී. ඒ. ගොඩලියද්ද,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2011 දෙසැම්බර් මස 22 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**අයදුම් පත්‍රය**

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

*වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර තනතුර*

1. (අ) සම්පූර්ණ නම :—————.
(ආ) මුලකුරු සමග නම :—————.

2. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

3. (අ) ලිපිනය :————.
   (ආ) ස්ථිර පදිංචි ලිපිනය :————.
   (ඇ) දුරකථන අංකය :————. නිවස :————.
   ජංගම :————.
   (ඈ) විද්‍යුත් තැපැල් ලිපිනය :————.

4. පදිංචි දිස්ත්‍රික්කය :————.

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :————.

6. උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න)
   (අ) අවුරුද්ද :————, මාසය:————, දිනය :————,
   (ආ) උපන් ස්ථානය :————.
   (ඇ) 2012.01.23 දිනට වයස :
   අවුරුදු :————, මාස :————, දින :————,

7. ජාතික හැඳුනුම්පත් අංකය :————.

8. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? ඔව්/නැත :————.
   ජාතිය

| | | | |
|---|---|---|---|
| සිංහල : | | මුස්ලිම් : | |
| ශ්‍රී ලංකා ද්‍රවිඩ : | | වෙනත් : | |
| ඉන්දියානු ද්‍රවිඩ : | | | |

9. *අධ්‍යාපනික සුදුසුකම්* : (සහිතකවල පිටපත් අමුණන්න)

9.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

පළමුවර :

විභාග අංකය :————. අවුරුද්ද :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

දෙවනවර (අවශ්‍යනම්) :
*විභාග අංකය* :————. *අවුරුද්ද* :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |

9.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය :

විභාග අංකය :————. අවුරුද්ද :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. ගණිතය | |
| 2. භෞතික විද්‍යාව | |
| 3. | |
| 4. | |

10. *තාක්ෂණික සුදුසුකම්* (සහතිකවල පිටපත් අමුණන්න) :
    (පාඨමාලාව හා කාර්මික විද්‍යාලේ නම සඳහන් කරන්න.)

11. ඔබ කලින් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවය කොට සේවය අතහැර ගියේ ද/අස්වූයේද/සේවය නතර කරනු ලැබුවේද/සේවයෙන් පහකරනු ලැබුවේද? එසේ නම් ඊට හේතු :————.

12. ඔබ දැනට රැකියාවක යෙදී ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
    (අ) තනතුර :————.
    (ආ) ආයතනය :————.
    (ඇ) පත්වීම ලද දිනය :————.
    (ඈ) පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්) :————.

13. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුර සඳහා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු එවැනි දෑ අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රජයේ දෙපාර්තමේන්තුවක/ පළාත් රාජ්‍ය සේවයක අයදුම්කරුවන් සඳහා පමණි.)*

........................ මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙම තනතුරට අයදුම් කිරීම සඳහා නියමිත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවලට අනුකූල බවත්, මම මින් සහතික කරමි. ඔහු/ඇය තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් වැඩි දුරටත් සඳහන් කිරීමට කැමැත්තෙමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන (නිල මුද්‍රාව)

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

01-167

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - ජාතික නැටුම්/සංගීත විභාගය - 2012 වර්ෂය

මෙම විභාගය 2012 මැයි මස පැවැත්වීම සඳහා ම විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විතය. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ ප්‍රධාන විෂයය සඳහා වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය ප්‍රධාන විෂයය සහ අනුවිෂයය යන දෙකටම පවත්වනු ලැබේ.

02. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් තුළ ම, අයැදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවක දී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවක දී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයැදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථාන පිහිටි නගරය වෙත යොමු කිරීමට සිදු වනු ඇත. 5.5 ඡේදයේ සඳහන් නගරවල මෙම විභාගය පැවැත්වේ.

03. මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

04. මෙම විභාගය පරිගණකගත විභාගයක් බැවින්, ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීමේදී පහත දැක්වෙන ආකෘතියට අනුකූලව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින්, ඇමුණුම 01 හා ඇමුණුම 02 පදනම් කර ගනිමින් සකස් කොට ඉදිරිපත් කළ යුතුය. අයැදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. දී ඇති උපදෙස් පරිදි ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයන් තෝරා ගැනීමෙන් වැළකී සිටිය යුතු ය. එසේ නොවන අයැදුම්පත් සහ අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඇමුණුම 01 සහ ඇමුණුම 02 බලන්න.)

05. *අයැදුම්කරුවන්ට උපදෙස්* :

5.1 *සුදුසුකම්* - සෑම අයැදුම්කරුවෙකුම පහත සඳහන් විභාග අතරින් එකක දී සිංහල භාෂා විෂයයෙන් සමත් වී සිටිය යුතු ය.

(*අ*) අ. පො. ස. (සා/පෙළ) විභාගය ;
(*ආ*) ජා. පො. අ. ස. විභාගය ;
(*ඇ*) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය ;
(*ඈ*) මූලික පිරිවෙන් අවසාන විභාගය.

ඉහත විභාගවලට සමාන හෝ ඉහල මට්ටමේ හෝ විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා ඇත්නම් එයද වලංගු වේ.

සැ. යු. : 5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සෑම අයැදුම්කරුවකුම මෙම විභාගයේදී සිංහල භාෂාව විෂයය ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතු ය. නැටුම් විභාගයට පෙනී සිටින අයැදුම්කරුවන් ශාස්ත්‍රීය අවබෝධය (නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම) ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටිය යුතු ය.

5.2 *වයස් සීමාව* : 2012.02.10 වැන දිනට වයස අවුරුදු 15 සම්පූර්ණ විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නොමැත. අත්සන සහතික කරන බලධාරියා ලවා උප්පැන්න සහතිකය පරීක්ෂා කරවා නිරවද්‍යතාව සහතික කිරීමට වග බලා ගත යුතු ය. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයැදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

5.3 *අයැදුම්පත්* : ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, ප්‍රාරම්භ පරීක්ෂණයේදී තෝරා ගන්නා ගණය (ප්‍රධාන විෂයය හා ඊට අනුකූල අනුවිෂයය) මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා ද යෙදේ. අයැදුම්කරුවන් ප්‍රාරම්භ පරීක්ෂණයේදී තෝරාගත් ගණය හෝ එම ගණයට අයත් තෝරාගත් විෂයන් හෝ මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා වෙනස් කළ නොහැකිය. එසේ කරනු ලබන අයැදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. ප්‍රාරම්භ පරීක්ෂණයේ ප්‍රධාන විෂයයට අනුකූල වන පරිදි අනුවිෂයය ද තෝරා ගැනීම කෙරෙහි අයැදුම්කරුවන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත් 2012.02.10 දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයැදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහල කෙළවරේ "ජාතික නැටුම්/සංගීත විභාගය - 2012" යනුවෙන් සඳහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයන් හා අනෙකුත් විස්තර සඳහා අදාළ ව්‍යවස්ථා හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය සඳහා විවිධ වූ විෂය අංක භාවිත වන බැවින් ඉහත 5.3හි

සඳහන් කරුණු පිළිබඳව මනා අවධානයෙන් හා සැලකිල්ලෙන් යුතුව ඇමුණුම 01 හා 02 පරිශීලනය කරමින් ඉතා නිවැරදිව අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. තවද ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 02 වන පිටුවට ද වන ලෙස, ඒ - 4 ප්‍රමාණයේ කඩදාසියක ඇයදුම්පත්‍රය සකස් කළ යුතු වේ. ආදර්ශ අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් (www.doenets.lk) බාගත කර ගත (Download) හැක.

5.5 විභාගය පැවැත්වෙන නගර සහ ඊට අදාළ අංක පහත දැක්වේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | මහනුවර | 10 |
| ගම්පහ | 02 | කෑගල්ල | 11 |
| කළුතර | 03 | මාතලේ | 12 |
| ගාල්ල | 04 | බදුල්ල | 13 |
| මාතර | 05 | අනුරාධපුරය | 14 |
| තංගල්ල | 06 | පොළොන්නරුව | 15 |
| රත්නපුර | 07 | කුරුණෑගල | 16 |
| අම්පාර | 08 | කුලියාපිටිය | 17 |
| මොනරාගල | 09 | | |

5.6 *විභාග ගාස්තු* : මෙම ලිඛිත විභාගයේ විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ.

රු. ශ.

* ප්‍රාරම්භ - 300 0
* මධ්‍යම - 400 0
* අවසාන - 500 0

අදාළ විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල් නමින් දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි අතර, එසේ අයදුම්කරුගේ නමින්ම මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු නොගෙවන අතර, එම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය. නියමිත ගාස්තු නොගෙවීමෙන් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප වේ. මුදල් ගෙවා ලබාගන්නා ලදුපතේ හා අයදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.7 ප්‍රවේශ පත්‍ර - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපත ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

5.8 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයදුම්කරුවන් විසින් සපයා ගත යුතු ය.

5.9 කිසියම් අයදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අදාළ අයදුම්කරු විභාගය සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කිරීමක් නොවේ. අයදුම්කරු සපයා ඇති තොරතුරු සාවද්‍ය බව හැඟී ගියහොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ, කිසියම් විභාග අපේක්ෂකයකු විභාගය සමත්වීම සඳහා ප්‍රධාන විෂයය සඳහා ලකුණු 40%ක්ද, ප්‍රායෝගික පරීක්ෂණයේ එක් එක් විෂයයෙන් 40%ක්ද, අවම වශයෙන් ලබාගත යුතු ය.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2011 දෙසැම්බර් මස 20 වැනි දින.
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
පැලවත්ත, බත්තරමුල්ල.

*ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*
*ජාතික නැටුම් විභාගය - 2012 'D'*

නැටුම්

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P, මධ්‍යම - M, අවසාන - F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින් | ඉංග්‍රීසි සංකේත අක්ෂරය

| *ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්)* | *එහි අංකය* |
|---|---|
| | |

1\. (අ) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
උදා : SILVA, A. B.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2\. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3\. ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4\. ජාතික හැඳුනුම්පත් අංකය :

5\. ඉල්ලුම් කරන විෂයයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට් නිවේදනයේ ඇමුණුම 01 බලන්න.*)

ප්‍රධාන විෂයය :

| *විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

අනු විෂයය :

| *විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

6\. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(*ගැසට් නිවේදනයේ* 05 වැනි ඡේදය බලන්න.)

7. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර :

| | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

8. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථය ලැබූ විභාගය පිළිබඳ විස්තර

1. වර්ෂය :
2. විභාග අංකය :
3. ඌන සාමාර්ථය ලත් විභාගය :
4. ඌන සාමාර්ථය ලත් අනු විෂයය : විෂයය අංකය :

(මෙහි ඇතුළත් ඇමුණුම 1 ලේඛනයේ සඳහන් විෂය අංකයම සඳහන් කරන්න. ඌන සාමාර්ථය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

9. (අ) උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

(ආ) 2012.02.10 වැනි දිනට වයස :

අවුරුදු : මාස : දින :

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

10. ගෙවන ලද විභාග ගාස්තු : (වචනයෙන්) රු. ————.
(ඉලක්කමෙන් රු. ————. )
විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :————.
දිනය :————.
(මුද්දර අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

11. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

| |
|---|
| රිසිට් පත මෙහි අලවන්න. |

(එහි අංකය සහ දිනය පැහැදිලි සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු ................................... දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බව ද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ............... බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ඇයගේ උපන්දිනය .............................. බව ද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15ට වැඩි බව ද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :————.
තරාතිරම :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

ලිපිනය :————.

දිනය :————.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

***සැලකිය යුතුයි*** - (අත්සන සහතික කිරීම අනුමත පාසලක ප්‍රධානියෙකු, ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 240,360.00 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන කෙනෙකු හෝ පරිවේණාධිපති, විහරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

ජාතික නැටුම් විභාගය - 2012 " D "
නැටුම් - විෂය ලේඛනය හා විෂය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| **නැටුම්** | | | |
| සබරගමු නැටුම් | 110 | 210 | 310 |
| පහතරට නැටුම් | 120 | 220 | 320 |
| උඩරට නැටුම් | 130 | 230 | 330 |
| **බෙර වාදනය** | | | |
| පහතරට බෙර වාදනය | 140 | 240 | 340 |
| උඩරට බෙර වාදනය | 150 | 250 | 350 |
| (ආ) අනු විෂයය | | | |
| සංගීතය | 112 | 212 | 312 |
| **බෙර වාදනය** | | | |
| සබරගමු හේවිසි වාදනය | 113 | 213 | 313 |
| පහතරට බෙර වාදනය | 141 | 241 | 341 |
| උඩරට බෙර වාදනය | 151 | 251 | 351 |
| ජන ගායනා | 114 | 214 | 314 |
| **භාරතීය නැටුම්** | | | |
| කතක් | 115 | 215 | 315 |
| කතකලි | 116 | 216 | 316 |
| මනිපූරි | 117 | 217 | 317 |
| භරත | 118 | 218 | 318 |
| **සාම්ප්‍රදායික නැටුම්** | | | |
| සබරගමු නැටුම් | 111 | 211 | 311 |
| පහතරට නැටුම් | 121 | 221 | 321 |
| උඩරට නැටුම් | 131 | 231 | 331 |
| නිර්මාණ | 119 | 219 | 319 |
| **ශාස්ත්‍රීය අවබෝධය** | | | |
| නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම | 122 | 222 | 322 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | | 001 | |

ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයය ලේඛනය

(මෙම විෂයන් තෝරා ගැනීමෙන් වැලකිය යුතුය.)

| *ප්‍රධාන විෂයය හා විෂය අංකය* | | *අනුවිෂයය හා විෂය අංකය* | |
|---|---|---|---|
| සබරගමු නැටුම් | 110/210/310 | සබරගමු නැටුම් | 111/211/311 |
| පහතරට නැටුම් | 120/220/320 | පහතරට නැටුම් | 121/221/321 |
| උඩරට නැටුම් | 130/230/330 | උඩරට නැටුම් | 131/231/331 |
| පහතරට බෙර වාදනය | 140/240/340 | පහතරට බෙර වාදනය | 141/241/341 |
| උඩරට බෙර වාදනය | 150/250/350 | උඩරට බෙර වාදනය | 151/251/351 |

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ජාතික සංගීත විභාගය - 2012 'M'

**සංගීත**

[ ]

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P, මධ්‍යම - M, අවසාන - F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින් [ ]

ඉංග්‍රීසි සංකේත අක්ෂරය [ ]

| *ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්)* | *එහි අංකය* |
|---|---|
| | |

1. (අ) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
උදා : SILVA, A. B.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (ගැසට් නිවේදනයේ ඇමුණුම 01 බලන්න.)

ප්‍රධාන විෂයය

| විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

අනු විෂයය

| විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(ගැසට් නිවේදනයේ 05 වැනි ඡේදය බලන්න.) [ ]

7. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය<br>වර්ෂය | | | |

8. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ්‍යය ලැබූ විභාගය පිළිබඳ විස්තර :-

1. වර්ෂය :- [ ]
2. විභාග අංකය :- [ ]
3. ඌන සාමාර්ථ්‍යය ලත් විභාගය :- [ ]
4. ඌන සාමාර්ථ්‍යය ලත් අනු විෂයය :- [ ] විෂයය අංකය :- [ ]

(මෙහි ඇතුළත් ඇමුණුම 2 ලේඛනයේ සඳහන් විෂය අංකය ම සඳහන් කරන්න. ඌන සාමාර්ථ්‍යය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

9. (අ) උපන් දිනය :

අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(ආ) 2012.02.10 වැනි දිනට වයස :

අවුරුදු : [ | | | ] මාස : [ | ] දින : [ | ]

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

10. ගෙවන ලද විභාග ගාස්තු වචනයෙන් රු. ——————.
(ඉලක්කමෙන් රු. ——————. )
විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :——————.
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :——————.
දිනය :——————.
(මුද්දර අලවා එවන අයැදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

11. විභග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

රිසිට් පත මෙහි අලවන්න.

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු ................................... දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බව ද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .............. බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ඇයගේ උපන්දිනය ............................. බවද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15ට වැඩි බවද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :————.
තරාතිරම :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)
ලිපිනය :————.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන

දිනය :————.

*සැලකිය යුතුයි .-* (අත්සන සහතික කිරීම අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරියකු, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 240,360.00 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන කෙනෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයකු විසින් හෝ සහතික කළ හැකිය.)

*ඇමුණුම 02*

**ජාතික සංගීත විභාගය - 2012 " M "**

සංගීත - විෂය ලේඛනය හා විෂය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| ගායනය | 160 | 260 | 360 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 171 | 271 | 371 |
| එස්රාජ් | 172 | 272 | 372 |
| සරෝද් | 174 | 274 | 374 |
| සිතාර් | 175 | 275 | 375 |
| බටනලා | 176 | 276 | 376 |
| සාරංගි | 177 | 277 | 377 |
| ගිටාර් | 178 | 278 | 378 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 190 | 290 | 390 |
| (ආ) අනු විෂයය | | | |
| ගායනය | 161 | 261 | 361 |

ස්වර වාදනය

| | | | |
|---|---|---|---|
| වයලීන් | 181 | 281 | 381 |
| එස්රාජ් | 182 | 282 | 382 |
| සරෝද් | 184 | 284 | 384 |
| සිතාර් | 185 | 285 | 385 |
| බටනලා | 186 | 286 | 386 |
| සාරංගි | 187 | 287 | 387 |
| ගිටාර් | 188 | 288 | 388 |

තාල වාදනය

| | | | |
|---|---|---|---|
| තබ්ලා | 191 | 291 | 391 |

| | |
|---|---|
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 |

* ප්‍රධාන විෂයය හා සමාන වන ලෙස අනුවිෂයය තෝරාගත නොහැකිය.

*උදා* :- (i) ප්‍රධාන විෂයය "ගායනය" හා අනුවිෂයය "ගායනය"
(ii) ප්‍රධාන විෂයය වාදනය "වයලීනය" හා අනුවිෂයය වාදනය "වයලීනය" ආදී වශයෙනි.

01-155

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2012**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2012.01.06 | සිකුරාදා | 2011.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.13 | සිකුරාදා | 2011.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.20 | සිකුරාදා | 2012.01.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.01.27 | සිකුරාදා | 2012.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2012.02.03 | සිකුරාදා | 2012.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.10 | සිකුරාදා | 2012.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.17 | සිකුරාදා | 2012.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.02.24 | සිකුරාදා | 2012.02.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2012.03.02 | සිකුරාදා | 2012.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.09 | සිකුරාදා | 2012.02.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.16 | සිකුරාදා | 2012.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.23 | සිකුරාදා | 2012.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.30 | සිකුරාදා | 2012.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.